# කොළඹ විශ්වවිද්‍යාලය

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී උපාධි පළමු වසර පරීක්ෂණය

## පළමු සෙමෙස්තරය - 2015/2016

## FND 1104– කලාව හා සංස්කෘතිය පිළිබඳ ගැටලු

(පැ දෙකයි)

ප්‍රශ්න <u>හතරකට</u> (04) <u>පමණක්</u> පිළිතුරු සපයන්න.

---

1. "යහපත් සමාජ සංස්කෘතික ජීවිතයක් මිනිසාට උරුම වන්නේ රටක 'නීතිය' හා 'යුක්තිය පසිඳලීම සියලු පුරවැසියන්ට සාධාරණව ක්‍රියාත්මක වන තත්වයකය." මේ අදහස සම්බන්ධයෙන් ඔබේ අදහස් දක්වන්න.

2. "බහුවාර්ගික -බහුආගමික සමාජයක නිරාකූල පැවැත්ම උදෙසා ගතානුගතික දෘෂ්ටිවාද බාධා ඇති කරයි." මේ අදහස නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

3. <u>එක්කෝ</u>

"රස වින්දන කුසලතාව" මනුෂ්‍ය සමාජය තුළ දියුණු කළ යුතු වන්නේ විචාරශීලී අන්දමින් මානව ජීවිතය හා සමානව සමාජය අවබෝධ කර ගැනීමටය. මේ අදහස විභාග කරන්න.

<u>නැතහොත්</u>

කලාව හා සාහිත්‍යය පරිශීලනයෙන් මානව ධර්මතා විෂයෙහි අත් පත් කර ගත හැකි ජීවිතාවබෝධය කවරාකාරදැයි නිදසුන් ඇසුරින් විභාග කරන්න.

****************

4. පහත සඳහන් මාතෘකාවලින් <u>**දෙකක්**</u> තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

   a. සදාචාරය යනු කුමක් ද?
   b. සාහිත්‍ය කලාව හා සංස්කෘතිය
   c. නිර්මාණකරණය හා දේශපාලනය

5. නූතන ප්‍රචාරණ කලාවේ ස්වරූපය මානව පුරුෂාර්ථ හා සමාජ සංස්කෘතික සබඳතා කෙරේ කවරාකාර බලපෑම් කරන්නේ ද යන්න පැහැදිලි කරන්න.

6. <u>**එක්කෝ**</u>

"සංස්කෘතික පරිහානිය" සහ "සංස්කෘතියක් වෙනස් වීම" යන්න පැහැදිලි කරමින්, වඩා ශිෂ්ට සමාජයක පැවැත්ම උදෙසා සංස්කෘතික සාරධර්ම ඉවහල් වන අන්දම පෙන්වා දෙන්න.

<u>**නැතහොත්**</u>

"වියපත් වන මධ්‍යම පාන්තික අඹු සැමියන්ගේ ජීවිත ආශාවන් හා සංස්කෘතිය පිළිබඳ සංකීර්ණ යථාර්ථය **'ඇගේ ඇස අග'** සිනමා කෘතියෙන් සාකච්ඡා කෙරේ." මේ ගැන ඔබේ අදහස් දක්වන්න.

7. ලාංකේය සමාජයේ පවත්නා කුල පීඩනය ගැන අදහස් දක්වමින් **'රාජපක්ෂ වලව්ව'** නවකතාව ඔස්සේ කතුවරයා පෙන්වා දෙන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

********************